සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

V

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2005

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2005 අගෝස්තු

## I පත්‍රය

මිනිත්තු 45 යි.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණයි.

| පිටු අංක | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |

අවසාන ලකුණ

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

සංකේත අංක

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය | |

### විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්


* ඔබේ විභාග අංකය මේ කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.

විභාග අංකය :.......................................

* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
* පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
* පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
* කටු වැඩ කිරීම සඳහා කඩදාසි දෙකක් සපයනු ලැබේ.

**අංක 1 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවායින් නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුරට යටින් ඉරක් අඳින්න.**


**1.** මෙම රූපවලින් දක්වා ඇති ද්‍රව්‍ය, කාණ්ඩ දෙකකට වෙන් කළ හැකි ය.




එම කාණ්ඩ නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) **C, D** **A, B** (2) **B, C** **A, D** (3) **B, D** **A, C**


**2.** මෙම රූපවලින් දක්වා ඇති සතුන්, කාණ්ඩ තුනකට වෙන් කළ හැකි ය.





එම කාණ්ඩ නිවැරදි ව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) **A, D** **C, E** **B, F** (2) **A, E** **B, C** **D, F** (3) **C, F** **B, D** **A, E**


**3.** මෙම රූපය සම්පූර්ණ කිරීම සඳහා පහත දක්වා ඇති කොටස් අතරින් යොදා ගත හැකි කොටස තෝරන්න.






(1) (2) (3)

**4.** මෙම රූප පේළියේ ඊළඟ ස්ථානයට ගැළපෙන රූපය පහත දක්වා ඇති රූප අතරින් තෝරන්න.


 ............



(1) (2) (3)


- අංක **5** හා **6** ප්‍රශ්නවල දැක්වෙන සංඛ්‍යා රටාව තේරුම් ගෙන හිස් තැනට (?) ගැළපෙන අගය තෝරන්න.

**5.**





(1) 50 (2) 40 (3) 30

**6.**




(1) 39 (2) 42 (3) 46

**7.** පහත සඳහන් රූපයේ ලොකු රෝදය ඊතලයෙන් පෙන්වා ඇති දිසාවට කැරකුවහොත් A සහ B වෙනස් වන්නේ කෙසේ ද?




නිවැරදි පිළිතුර තෝරන්න.

(1) A පහළට යන අතර B ඉහළට ගමන් කරයි.
(2) A සහ B ඉහළට එසවේ.
(3) A ඉහළට යන අතර B පහළට ගමන් කරයි.

- පහත දැක්වෙන ඡේදයේ රූපයකින් දක්වා ඇති ස්ථානයට ගැළපෙන **නිවැරදි වචනය** දී ඇති පිළිතුරු අතරින් තෝරා අංක **8, 9** හා **10** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


එක්තරා දවසක්  විලක් උඩින් පියඹා යද්දී එම විල සිඳී ගොස් ඇති බව දුටුවේ ය. එම විලෙහි  මහත් අමාරුවෙන් ජීවත්වන බව දුටු කොකා ඌ ගැන අනුකම්පා උපදවා විල ළගට අවුත් උඹව  පිරි ලස්සන විලකට ගෙන ගොස් ඇරලන්න දැයි විමසී ය.

**8.**  රූපයට ගැළපෙන පදය තෝරන්න.

(1) කොකා (2) කොකෙක් (3) කොකකු

**9.**  රූපයට ගැළපෙන පදය තෝරන්න.

(1) ඉබ්බා (2) ඉබ්බෙක් (3) ඉබ්බකු

**10.**  රූපයට ගැළපෙන පදය තෝරන්න.

(1) මත්ස්‍යයින් (2) මත්ස්‍යයකු (3) මත්ස්‍යයෝ

[ හතරවැනි පිටුව බලන්න.

11. අද උදෑසන රැස්වීමේ දී පංතියේ ළමයෙක් ක්ලාන්ත වී බිම ඇද වැටුණේ ය. ඔහුට එලෙස ක්ලාන්තයක් ඇතිවීමට බලපාන්නට ඇතැයි සිතිය හැකි හේතුව තෝරන්න.
   (1) ඊයේ හවස්වනතුරු ඔහු ක්‍රීඩා කිරීම
   (2) රැස්වීමේ දී කථා කළ දේවල් ඔහුට ප්‍රිය නොවීම
   (3) ඔහු උදයට ආහාරයක් නොගෙන පාසල් පැමිණීම

12. ඊයේ පාසලේ දී දෙන ලද අභ්‍යාස නිම කර නොපැමිණි නිසා අද ගුරුතුමිය සුනිල්ට දෙස් පැවරුවා ය. සුනිල් එලෙස අභ්‍යාස නිම නොකිරීමට අදාළ විය හැකි හේතු හතරක් මෙසේ ය.
   (A) සුනිල් රැබෝවන තෙක් රූපවාහිනිය නරඹන්නට ඇත.
   (B) සුනිල්ට එම අභ්‍යාසය ගැන මතක නැතිවන්නට ඇත.
   (C) සුනිල් ඊයේ පාසල් නොඑන්නට ඇත.
   (D) සුනිල්ට එම අභ්‍යාසය අමාරු එකක් වන්නට ඇත.

මේ හේතු අතරින් සැබැවින් ම සුනිල්ට එම අභ්‍යාසය නිමකරන්නට බැරිවන්නට අදාළ හේතු අඩංගු පිළිතුර තෝරන්න.
   (1) A B C   (2) A B D   (3) B C D

● අංක **13** හා **14** ප්‍රශ්නවල දක්වෙන ප්‍රස්තාව පිරුළුවල **අදහස හොඳින් විස්තර කරන** පිළිතුර තෝරන්න.

13. වඳුරා හැට පිරුණත් බිමින් නොයයි.
   (1) වයස් ගත වූ අයට සමහර දේ කළ නොහැකි ය.
   (2) වයස් ගත වූ අයට සමහර දේ කරන්නට පුහුණුවක් නැත.
   (3) වයස් ගත වුවත් සමහරු නොගැළපෙන දේ නොකරති.


14. සිංහයා බඩගිනි වුවත් තණ නුබුදියි.
   (1) සමහරු දුප්පත් වුවත් නුසුදුසු වැඩ නොකරති.
   (2) සමහරු දුප්පත් වුවත් රස අහර ම සොයති.
   (3) සමහරු දුප්පත් වුවත් අනුන්ට යටත් නොවෙති.


● අංක **15** හා **16** ප්‍රශ්නවල වැරදි අදහසක් අඩංගු පිළිතුර තෝරන්න.


15. (1) කෙසෙල් පළතුරකි; කෙසෙල් අප රටේ වැවෙයි.
   (2) සහල් ධාන්‍ය වර්ගයකි; වී කොටාගත්විට සහල් ලැබේ.
   (3) පතෝල එළවළු වර්ගයකි; පතෝල පිටරටවලින් ගෙන්වනු ලැබේ.

16. (1) බල්ලා ගෙවල ඇතිකරන සතෙකි; ඌ සිවුපාවෙකි.
   (2) කපුටා පක්ෂියෙකි; ඌ ශාක බුදින්නෙකි.
   (3) මිනිසා දෙපා සතෙකි; හේ ක්ෂීරපායී වර්ගයට අයත් ය.


● අංක **17** හා **18** ප්‍රශ්නවල මුලින් දක්වෙන්නේ කිසියම් වස්තුවක් (භාණ්ඩයක්) අහසේ සිට කෙළින් බලන විට දිස්වන ආකාරය ය. එම වස්තුව පැත්තෙන් බැලූ විට දිස්වන ආකාරය දක්වෙන රූපය තෝරන්න.


17. 


(1)


(2)


(3)


18. 


(1)



(2)


(3)

- පහත දැක්වෙන්නේ ලී කැබලි කිහිපයක් එකිනෙකට ගැවෙන සේ තබා ඇති ආකාරයකි. එය බලා අංක 19 හා 20 ප්‍රශ්නවලට පිළිතුරු තෝරන්න.





19. මේ ලී කැබලි කිහිපය දෙස A පැත්තේ සිට බලන විට පෙනෙන ආකාරය තෝරන්න.



(1) (2) (3)


20. මේ ලී කැබලි කිහිපය දෙස B පැත්තේ සිට බලන විට පෙනෙන ආකාරය තෝරන්න.



(1) (2) (3)


- අංක 21 හා 22 ප්‍රශ්නවල මුල් රූපයෙන් කඩදාසි කැබැල්ලක් හතරට නවා එහි සිදුරු කිහිපයක් විද ඇති ආකාරය දැක්වෙයි. එම කඩදාසි කැබැල්ල නැවත දිග හැරිය විට දැකිය හැකි රූපය තෝරන්න.

21.



(1) (2) (3)


22.



(1) (2) (3)

- අංක 23 හා 24 ප්‍රශ්නවල ගැටලු තේරුම් ගෙන දක්වා ඇති රූපයේ අගය සොයන්න.

23.




 රූපයේ අගය පහත දැක්වෙන ඒවායින් තෝරන්න.

(1) 6 (2) 4 (3) 2

**24.**

△ + △ + △ = ○

△ × △ = ◖4

◖ + ○ + △ = □

□ රූපයේ අගය පහත ඒවායින් තෝරන්න.

(1) 8 (2) 10 (3) 12

- පහත දක්වෙන කුඩා ඡේදයේ කොටස් දෙකක් කපා ඉවත් කොට තිබේ. එම කපා ඉවත් කොට ඇති කොටස් දෙක තෝරා අංක 25 හා 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මුද්දර එකතු කිරීම ක්‍රමවත් ව පිරිසිදු ව ප්‍රවේසමෙන් කළ
යුතු සියුම් **[A]** කුරුල්ලන්, මල් වර්ග ආදි තේමා යටතේ
හෝ රට **[A]** වශයෙන් හෝ තමන් කැමති ආකාරයකට
මුද්දර රැස් **[A]** ඒවා මුද්දර සුරැකුම් පොතක ඇලවිය
යුතු ය. කුඩා **[A]** මුද්දර එකතු **[B]** ජීවිතය ද
ක්‍රමානුකූල ව හැඩ ගස්වා ගැනීමට **[B]** ලෝලියා
හැම විටම තමාගේ මුද්දර එකතුව තර කර **[B]** දරයි.
ඔහු ලෝකයේ වෙනත් රටවල මුද්දර **[B]** සමග
සම්බන්ධ වෙමින් ලියුම් හුවමාරු කර ගනියි. මුද්දර එකතු කරමින්
මෙම විනෝදාංශයෙහි යෙදෙන්නාට ටික කලක් ගතවන විට තමාගේ
මුද්දර එකතුව දෙස බලා තුටුපහටු විය හැකි ය.

**25.** A හිස්තැනට සුදුසු කොටස තෝරන්න.

(1)
කාර්යයකි.
රටවල් අතර
කරන්නාට
කාලයේ සිට

(2)
කටයුත්තකි.
රටවල මුද්දර
කළ හැකි ය.
කාලයේ සිට

(3)
වැඩකි.
රට රටවලට
කිරීමෙන් ද
සංඛ්‍යාවලින්


**26.** B හිස්තැනට සුදුසු කොටස තෝරන්න.


(1)
කරන අය
පෙලඹෙයි. ඔහු
ගැනීමට වෙර
රැස් කරන්නන්


(2)
කරන විට
පෙලඹෙන මුද්දර
ගෙන්වාගැනීම
රැස් කරන්නන්


(3)
කරන්නා තම
පෙලඹෙයි. මුද්දර
ගැනීමට වෙර
රැස් කරන්නන්

**27.** රූපයේ හිස් කොටුවලට ගැළපෙන කොටස කුමක් දැයි තෝරන්න.





(1)



(2)



(3)


[ හත්වැනි පිටුව බලන්න.

**28.** 

මෙම රූපයෙන් දක්වා ඇති කාඩ් බෝඩ් පෙට්ටිය සෑදීමට භාවිත කර ඇති කාඩ් බෝඩ් කැබැල්ල තෝරන්න.


(1)


(2)


(3)

**29.** සමනල විද්‍යාලය පිහිටා ඇත්තේ මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ හැටන් අධ්‍යාපන කලාපයේ ය. ඒවා පහත සඳහන් පරිදි සංකේතවලින් දක්වේ.

කලාපය =  පළාත =  දිස්ත්‍රික්කය =  පාසල = 

පාසලේ පිහිටීම නිවැරදි ව පෙන්වා ඇති සටහන තෝරන්න.


(1)



(2)





(3)

**30.** පාසලක් ආරම්භ කොට වසර පණහක් ගත වීමේ උත්සවය පවත්වන ලද්දේ 2005 වසරේ දී ය. එම උත්සවයට සහභාගි වන විට ප්‍රියංකරගේ වයස අවුරුදු 10 කි. එම විද්‍යාලයට වසර සියයක් පිරෙන උත්සවය පවත්වන විට ප්‍රියංකරගේ වයස අවුරුදු කීයක් විය හැකි ද? පිළිතුර තෝරන්න.

(1) අවුරුදු 40 යි (2) අවුරුදු 50 යි (3) අවුරුදු 60 යි

| අංක **31** සිට **40** තෙක් දී ඇති ප්‍රශ්නවලට **පිළිතුරු තිත් ඉර මත ලියන්න.** |
|---|

**31.** **1** සිට **6** තෙක් ඉලක්කම් දක්වෙන සේ තිත් යොදා ඇති දාදු කැටයක මුහුණත් කිහිපයක් පහත රූපවලින් පෙන්නුම් කර ඇත. ඒවා සැලකිල්ලට ගෙන  පැත්තට විරුද්ධ පැත්තේ ඇති තිත් ගණන කීයක් වේ දැයි සොයා ලියන්න.

...............


**32.** **මරදන, කඩවත, කලවාන** යන වචන **2109, 2735, 6489** යන ඉලක්කම් යොදාගෙන ලියා තිබුණි.
එසේ නම්,
**කලවාන** යන වචනය ලිවීමට යොදාගෙන තිබෙන ඉලක්කම් මොනවා ද? පිළිතුර ලියන්න.

...............

**33.** මහා මාර්ගයක් පියවර තුනකින් ඉදිකිරීමට සැලසුම් කරන ලදී. එහි පළමුවන හා දෙවන පියවරවල් ඉදිකිරීමට ගත වූ කාලයෙන් බාගයක් තුන්වන පියවර ඉදිකිරීම සඳහා ගතවේ. එම මහා මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2000 වසර මුල දී ආරම්භ කොට පළමුවන හා දෙවන පියවරවල ඉදිකිරීම් කටයුතු 2005 වසර අවසානයේ නිම කරන ලදී. සැලසුමට අනුව මහා මාර්ගය සම්පූර්ණ වශයෙන් ම ඉදිකළ හැකි වන්නේ කුමන වසර අවසානයේ දී ද?

...............

**34.** එංගලන්තයේ වේලාව ශ්‍රී ලංකාවේ වේලාවට වඩා පැය 6 ක් අඩු ය. නිතරම පැයක් ප්‍රමාදව වේලාව පෙන්නුම් කරන මේ ඔරලෝසුවේ දැක්වෙන වේලාව පස්වරු 4.10 වන විට එංගලන්තයේ වේලාව කීය ද?





..............................

**35.** එංගලන්තයේ වේලාව පස්වරු 6.00 වන විට මෙම ඔරලෝසුවේ පෙන්නුම් කරන වේලාව කීය ද?

..............................

● පහත කොටු තුළ දක්වෙන රූප කිසියම් පොදු ලක්ෂණයක් අනුව රූප තුන බැගින් කාණ්ඩ කළ හැකි ය. එම රූප තුන බැගින් කාණ්ඩ කොට ඒවායේ අක්ෂරත් කාණ්ඩ කිරීමට යොද ගත් පොදු ලක්ෂණත් ලියන්න. නිදසුන බලන්න.




නිදසුන : රූපවල අක්ෂර — කාණ්ඩ කිරීමට යොදගත් පොදු ලක්ෂණය

G H L — වාහන

| | රූපවල අක්ෂර | කාණ්ඩ කිරීමට යොදගත් පොදු ලක්ෂණය |
|---|---|---|
| **36.** | ...... ...... ...... | .............................................. |
| **37.** | ...... ...... ...... | .............................................. |
| **38.** | ...... ...... ...... | .............................................. |

● අංක **39** හා **40** ප්‍රශ්නවල නිසි ලෙස පද බෙද නොමැති වාක්‍යය බැගින් ඉදිරිපත් කර තිබේ. එම වාක්‍ය නිසි පරිදි පද බෙද අර්ථවත් ලෙස ලියන්න.

**39.** **පොතකි යවත විටයි තටක වරතම්ස හතයක් ද?**

..........................................................................................................................

**40.** **අපකු ධාදි වයිනසා මයෙන්පි රීර ටක්බව ටපත්ක රමු.**

..........................................................................................................................

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department
Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

V

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2005

# පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වන ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2005 අගෝස්තු

## II පත්‍රය

පැය 01 මිනිත්තු 15 යි.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණයි.

| පිටු අංක | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |

අවසාන ලකුණ

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

සංකේත අංක

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |
| අධීක්ෂණය | |

### විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

* ඔබේ විභාග අංකය මේ කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.

විභාග අංකය :....................................

* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 55 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
* පිළිතුරු හතරක් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
* පිළිතුර ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
* කටු වැඩ කිරීම සඳහා කඩදාසි දෙකක් සපයනු ලැබේ.

- පහත දැක්වෙන ඡේදය කියවා ඒ ඇසුරෙන් අසා ඇති අංක **1** සිට **8** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඒ ගොවිතැන ජීවනෝපාය කරගත් අපේ පැරැන්නන්ගේ මහඟු සම්පත වූයේ ජලයයි. ගංගා මිටියාවත්හි පදිංචි වූ ඔවුහු ගංගා හරස්කොට සමුද්‍ර බඳු මහවැව් තැනූහ. වියළි කලාපය පුරා ම ඔවුන් ඉදි කළ ලොකු කුඩා වැව් සමූහය සිතියමේ ගත කළහොත් ශ්‍රී ලංකා සිතියමේ වියළි කලාපය තිත්වලින් වැසී යන තරම් ය. එදා සෑම ගමකට ම පාහේ වැව් දෙක තුනක්වත් තිබූ බවට අදටත් නෂ්ටාවශේෂ සාක්ෂි දරයි. ඒ නිසා ම අතීතයේ වියළි කලාපය "වැව් බැඳි රාජ්‍යය" නමින් හඳුන්වනු ලැබී ය.

1. **"ජීවනෝපාය"** යන්නට සමාන අර්ථය දෙන පදයක් ලියන්න. ..............................

2. **"වියළි"** යන්නට විරුද්ධ අර්ථය දෙන පදයක් ලියන්න. ..............................

3. මෙහි වැව් උපමා කොට ඇත්තේ කුමකට ද? ..............................

4. **"පුරාණ කාලයේ විසූ මිනිසුන්"** යන්නට තනි වචනයක් ලියන්න. ..............................

5. පහත දැක්වෙන වැකියේ **උක්ත** පදයට යටින් ඉරක් අඳින්න.
"ගංගා මිටියාවත්හි පදිංචි වූ මිනිස්සු ගංගා හරස්කොට මහ වැව් තැනූහ."

6. පහත සඳහන් වැකියේ ඇති **විශේෂණ පද දෙකක්** තෝරා ඒවා යටින් ඉරක් අඳින්න.
"ඒ ගොවිතැන ජීවනෝපාය කරගත් අපේ පැරැන්නන්ගේ මහඟු සම්පත වූයේ ජලයයි."

7. **"නෂ්ටාවශේෂ"** යන්නෙහි තේරුම කුමක් ද?
..............................................................................................................

8. **"තිත්වලින් වැසියන තරම් ය"** යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
..............................................................................................................

9. කොටුවේ ඇති වචන **පමණක්** යොදා ගෙන නිවැරදි අර්ථවත් වැකි **හතරක්** ලියන්න.
(එක් එක් වැකියට වචන **හතරක්වත්** ඇතුළත් කරන්න.)

| | | | | |
|---|---|---|---|---|
| දෙමාපියෝ | චිත්‍ර | ගියෙමු | අද්දර | අපි |
| ගස් | යට | නරඹා | ළමයින් | සීගිරිය |
| සෙනසුරාද | ගියාය | ගුරුතුමිය | වැව | ඉඳගත්හ |
| බැලීමට | සිසුහු | ගොස් | නැරඹූහ | සෙවණේ |

(i) ..............................................................................................................
(ii) ..............................................................................................................
(iii) ..............................................................................................................
(iv) ..............................................................................................................

10. කළු අකුරින් ඇති යෙදුම්වල අදහස ලියන්න.
(i) **උඩින් පල්ලෙන්** වැඩ කරන අයට කිසිවකු කැමති නැත.
..............................................................................................................
(ii) **වැල් වටාරම්** දොඩවන්නේ නැතුව වෙච්ච දේ කියන්න.
..............................................................................................................

11. පහත දැක්වෙන වාක්‍යවල අවශ්‍ය තැන්වල **විරාම ලකුණු** යොදන්න.
(i) අපොයි අම්මෙ ඒ වෙලාවෙ ලොකු අක්කා මොනවා කරන්න ද
(ii) සැරදූ මහ රජතුමණි ඔබතුමා ඊයේ රාත්‍රියේ දුටුවේ කවර නම් සිහිනයක් ද

[ තුන්වැනි පිටුව බලන්න

 **විභාග අංකය** : ..........................................

**12.** එක් එක් සිංහල වචනය සඳහා ගැළපෙන ඉංග්‍රීසි වචනය (**ඉංග්‍රීසි අකුරෙන්**) ලියන්න.

(i) ඉරිදා ............................ (ii) කළු ............................ (iii) යහළුවා ............................


**13.** අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Happy new year : ..........................................................................

(ii) Please be silent. : ..........................................................................

(iii) Let us go home. : ..........................................................................

**14.** පහත දැක්වෙන එක් එක් දෙමළ වචනයේ අර්ථය සිංහලෙන් තිත් ඉරිමත ලියන්න.




- අංක **15** සිට **32** තෙක් ප්‍රශ්නවල **නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න**.

**15.** රුපියල් 5.00 ක මුද්දරයක් අලවා තැපැල් කළ යුතු සාමාන්‍ය ලිපියක් එහි කවරය ඇලවීමකින් තොරව තැපැල්කර යැවීමට මුද්දර ගාස්තුව කීය ද?

(1) රුපියල් 3.00 (2) රුපියල් 3.50 (3) රුපියල් 4.00 (4) රුපියල් 4.50

**16.** පහත සඳහන් කර ඇති මල් වර්ග අතරින් පොකුරු කාණ්ඩයට අයත් මල් වර්ගය කුමක් ද?


(1) සූරියකාන්ත (2) අරලිය (3) ඉද්ද (4) වතුසුද්ද


**17.** ධීවරයින් කුඩා මසුන් ඇල්ලීමට යොදා ගන්නා ගොටුවක් වැනි උපකරණය හඳුන්වන නම කුමක් ද?


(1) නාම්බුව (2) මාදැල (3) අතංගුව (4) මඩිය

**18.** දී ඇති ආවුද අතරින් කම්බි ඇණයක් සවි කිරිමට සහ ගැලවීමට යොදා ගත හැකි වඩාත් ම සුදුසු උපකරණය වන්නේ


(1)


(2)


(3)


(4)

**19.** ක්ලාන්ත වූ රෝගියකුට වඩාත් ම සුදුසු ප්‍රථමාධාරය වන්නේ

(1) වතුර ටිකක් ඉසීම හා බීමට දීම ය.
(2) ඇඳුම් බුරුල් කොට පවන් සැලීම ය.
(3) හිස කෙළින් සිටින සේ වාඩි කරවා පවන් සැලීම ය.
(4) හිස හොඳින් පහළට හරවා වාතාශ්‍රය ලබාදීම ය.


[ හතරවැනි පිටුව බලන්න.

20. 

පහත දක්වා ඇති තරු රටාව හඳුන්වනු ලබන නම කුමක් ද?

(1) මහබල්ලා (2) ගෝනුස්සා (3) නගුල (4) හත්දින්නත් තරු

21. ගොළුබෙල්ලකු නිරීක්ෂණය කළ සිසුන් සිව්දෙනකු අඳිනලද රූප සටහන් පහත දැක්වේ. ඒවායින් ගොළුබෙල්ලාගේ අංගලක්ෂණ **වඩාත් ම නිවැරදි ව** පෙන්නුම් කරන රූපය වන්නේ




(1) (2) (3) (4)

22. බස් නැවතුමක නතර කළ බස්රියකින් බැසගත් මගියකු බසය ඉදිරියෙන් පාර හරහා පැනීම අනතුරුදායක වන්නේ

(1) දකුණු පසින් එන වාහන පැහැදිලිව නොපෙනෙන නිසා ය.
(2) වම් පසින් එන වාහන පැහැදිලිව නොපෙනෙන නිසා ය.
(3) මාර්ගයේ දෙපැත්තම පැහැදිලිව නොපෙනෙන නිසා ය.
(4) බස්රියේ රියදුරුට මගියා නොපෙනෙන නිසා ය.


23. සිසුන් කණ්ඩායමක් රූපයේ පෙන්වා ඇති පරිදි සැදූ ඇටවුමක ඇණයේ හිස වෙතට අල්පෙනෙත්තක් ළං කළ විට එය ඇණයේ ඇලුණි.




ඇණය සාදා ඇති ද්‍රව්‍ය විය යුත්තේ

(1) පිත්තල ය. (2) ඇලුමිනියම් ය. (3) යකඩ ය. (4) ප්ලාස්ටික් ය.

24. **වඩාත් ම නිවැරදි** ආකාරයට වියළි කෝෂ ඇතුළත් කර ඇති විදුලි පන්දම දැක්වෙන රූපය වන්නේ



(1) (2) (3) (4)

25. පහත නම් කර ඇති ශාක පත්‍රවලින් තුනක් හැඩයෙන් සමාන ය. වෙනස් හැඩය ඇති ශාක පත්‍රය වන්නේ

(1) බුලත් ය. (2) ගම්මිරිස් ය. (3) කැන්ද ය. (4) තිප්පිලි ය.

26. සිතියම්වල ගංගා දැක්වීමට යොදා ඇති සම්මත වර්ණය කුමක් ද?

(1) දුඹුරු (2) නිල් (3) දම් (4) කොළ

27. පිත්තල භාණ්ඩයක් පවිත්‍ර කොට ඔප ගැන්වීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය අතරින් වඩාත් ම සුදුසු ද්‍රව්‍යය කුමක් ද?

(1) ඉදුණු සියඹලා (2) පොල්කුදු (3) තේරොඩු (4) පිලිස්සූ දහයියා


28. පහන් තිරයක් දිගේ ඉක්මනින් ඉහළට ගමන් කරන තෙල් වර්ගය වන්නේ

(1) පොල්තෙල් ය. (2) අබතෙල් ය. (3) එළඟිතෙල් ය. (4) භූමිතෙල් ය.


29. එක සමාන තත්ත්වයන් යටතේ පැළ කළ විට පහත දැක්වෙන බීජ අතරින් ඉක්මනින් ම පැළවෙන බීජ වර්ගය වන්නේ


(1) මිරිස් ය. (2) අබ ය. (3) කරවිල ය. (4) බණ්ඩක්කා ය.


[ පස්වැනි පිටුව බලන්න


30. 

රූපයේ පෙන්වා ඇති මල් ඉත්ත ඇඳුමක මැසීමේ දී ඊතලයෙන් පෙන්නුම් කර ඇති කොටස මැසීමට පහත දැක්වෙන විසිතුරු මැහුම් ක්‍රම අතරින් වඩාත් ම සුදුසු මැහුම් ක්‍රමය වන්නේ


(1)


(2)


(3)


(4)


31. ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ පැති හතර වටා ඇති කහ වර්ණ තීරුවෙන් පෙන්නුම් කරන්නේ
(1) රට සාගරයෙන් වටවී ඇති බව ය.
(2) රටේ වෙසෙන ජාතීන්ගේ එකමුතු බව ය.
(3) රටේ ප්‍රධාන ජාතීන් හතරක් වෙසෙන බව ය.
(4) රටේ ආගම් හතරක් අදහන්නන් වෙසෙන බව ය.

32. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව දැක්වෙන රූපය වන්නේ


(1)


(2)


(3)


(4)

33. ශ්‍රී ලංකාව පළාත් කිහිපයකට බෙදා ඇත. එයින් පළාත් දෙකක් නම් කරන්න.

(i) .............................................. (ii) ..............................................

● **නිවැරදි වචනය වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**


**ජාතික ගීය ගායනා කරන අවස්ථාවල දී**


34. කය සෘජුව තබාගෙන, පා (ඇත්කොට / ළංකොට) අත් (මිට මොළවා / ඇඟිලි දිගුකොට) සිටිය යුතු ය.

35. හිස (ඉදිරියට / බිමට) හරවා, ඇස් (ඇරගෙන / වසාගෙන) සිටිය යුතු ය.

● නිවසෙ හා ගෙවත්තෙ සැරිසරන කෘමීන් සිව් දෙනකුගේ රූප සටහන් පහත දැක්වේ. කොටුවේ ඇති නම් අතරින් ඒ ඒ කෘමියාගේ නම තෝරා තිත් ඉර මත ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| ගෙමැස්සා | මීමැස්සා | කුඹලා | කැරපොත්තා | සමනලයා | බත්කූරා |
| සලබයා | කාවා | ගොයම්මැස්සා | | | |


.............................. 36.


.............................. 37.


.............................. 38.


.............................. 39.

● එක් එක් රූපයේ දැක්වෙන ශාකයේ නම පහත ඇති කොටුව තුළ සඳහන් නම් අතරින් තෝරා තිත් ඉර මත ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| රණවරා | ඇහැළ | දෙහි | කොස් | කරපිංචා |
| කතුරුමුරුංගා | කොහොඹ | ගොටුකොළ | | |






40. .................... 41. .................... 42. .................... 43. ....................

**44.** පාසලක් ඉදිරිපිට මහා මාර්ගයේ දකුණු පසට සහ වම් පසට පැයක් තුළ ගමන් කළ වාහන පිළිබඳ ව සිසුන් කණ්ඩායමක් රැස්කළ තොරතුරු පහත වගුවේ පෙන්වා ඇත.


| වාහන වර්ගය | ගමන් කළ වාහන සංඛ්‍යාව | |
|---|---|---|
| | දකුණු පසට | වම් පසට |
| ත්‍රීරෝද | 55 | 47 |
| කාර් | 60 | 44 |
| බස් | 45 | 25 |
| ලොරි | 25 | 20 |

(i) පාසල පසුකර ගමන් කළ මුළු ත්‍රීරෝද රථ සංඛ්‍යාව කීය ද? ............

(ii) වම් පසට ගමන් කළ මුළු වාහන සංඛ්‍යාව කීය ද? ............

(iii) වම් පසට වඩා දකුණු පසට කාර් කොපමණ සංඛ්‍යාවක් ගමන් කර තිබේ ද? ............

(iv) දකුණු පසට ගමන් කළ වාහන සංඛ්‍යා දැක්වෙන ස්ථම්භ ප්‍රස්තාරයක් අඳින්න. (ස්ථම්භ අඳුරු කරන්න.)




වාහන වර්ගය

(v) දකුණු පසට වැඩියෙන් ම ගමන් කළ වාහන වර්ගයේ සහ අඩුවෙන් ම ගමන් කළ වාහන වර්ගයේ සංඛ්‍යා අතර වෙනස කොපමණ ද? ............

[ හත්වැනි පිටුව බලන්න.

45. දිග හැර ඇති ශබ්දකෝෂයක දකුණු පැත්තේ පිටුවේ අංකය 1099 වේ. ඊළඟට දිග හැරෙන පිටු දෙකේ අංක පිළිවෙළින් ලියන්න.

(i) ................................ (ii) ................................

46. දොඩම් ගෙඩියක මිල රුපියල් 8 සත 50 ක් නම් ගෙඩි 12 ක් සඳහා ගෙවිය යුතු මුළු මුදල කීය ද?

රුපියල් ................................


47. එකකට 3 බැගින් සබන් කැට 318 ක් කඩදාසි කවරවල දැමිය යුතුව ඇත. මේ සඳහා කවර කීයක් අවශ්‍ය ද?

................................


48. එක් පැණිබීම බෝතලයක් 3 දෙනකුට සංග්‍රහ කිරීමට ප්‍රමාණවත් ය. 17 දෙනකුට සංග්‍රහ කිරීමට පැණිබීම බෝතල කීයක් අවශ්‍ය ද?

................................

49. දිනපොතක දිගත් පළලත් මිනුම් පටියකින් මැන්න විට, ලැබුණු මිනුම් ඊතල සළකුණු මගින් පහත පෙන්වා ඇත.





ඉහත මිනුම්, දී ඇති රූපයේ අදාළ හිස්තැන්වල ලකුණු කරන්න.




......... cm

......... cm

50. රූපයේ පෙන්වා ඇති පරිදි විශාල සමචතුරස්‍රය තුළ කුඩා සමචතුරස්‍ර කිහිපයක් ඇඳ ඇත. එක් කුඩා සමචතුරස්‍රයක වර්ගඵලය 1 $cm^2$ නම් විශාල සමචතුරස්‍රයේ වර්ගඵලය කොපමණ ද?




...............$cm^2$

51. පුනිමල්ගේ නිවසේ සිට පාසලට දුර 10 km වේ. ඔහු පාසලට ගියේ එම දුරින් $\frac{1}{5}$ ක් බයිසිකලයෙනි. ඉතිරි දුර දුම්රියෙනි. ඔහු දුම්රියෙන් ගිය දුර කොපමණ ද?

................ km

52. පෙන්වා ඇති සෘජුකෝණාස්‍ර රූපයේ සෘජුකෝණයක් සහිත ත්‍රිකෝණ කීයක් තිබේ ද?




......................

53. සමන්ගේ බර 25 kg 600 g වේ. ඔහුගේ පියා සමන් මෙන් දෙගුණයක් බර ය. පියාගේ බර කොපමණ ද?

................ kg ............ g

**54.** A ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාව B ඔරලෝසු මුහුණත මත පෙන්වීමට පැය කටුවත් මිනිත්තු කටුවත් ඇඳ පෙන්වන්න.




A B

**55.** පහත දැක්වෙන ඡේදය කියවන්න.

හිමිදිරියේ ම වැහි ඇඳිරිය අහස වසා තිබුණි. හේමාල්ගේ පාසල් ගමනට එය බාධාවක් නොවී ය. පොත් බෑගය තුරුළු කරගත් ඔහු පාසල බලා යෑමට නිවසින් පිටත්විය. එකවර මහ වැස්සක් ඇද හැලුණි. වැස්සට ගොඩවීමට අසල නිවසක් ද නොවී ය. හේමාල් බෑගය තම හිසමත තබාගෙන වේගයෙන් ඉදිරියට ම දිව ගියේ ය. . . . . . . . .

හේමාල්ට සිදුවන්නට ඉඩ ඇතැයි ඔබට හිතෙන දේ ගැන නිර්මාණාත්මක **වාක්‍ය හයක්** පහත සඳහන් රූප රාමු ඇසුරෙන් ලියන්න. එම වාක්‍යවල උක්ත (එක් එක් වාක්‍යයේ අඩු වශයෙන් වචන **හතරක්වත්** ඇතුළත් විය යුතු ය. එම වාක්‍යවල උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.)



(i) ..........................................................................................................

..........................................................................................................

(ii) ..........................................................................................................

..........................................................................................................

(iii) ..........................................................................................................

..........................................................................................................

(iv) ..........................................................................................................

..........................................................................................................

(v) ..........................................................................................................

..........................................................................................................

(vi) ..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

***